පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2017

| ශ්‍රේණිය |
| --- |
| 12 |

## විෂයය - සිංහල I

පාසලේ නම : ....................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ......................................................

...................................................... කාලය : පැය 3 යි.

Education NCP - www.edncp.lk

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**පහත සඳහන් ඡේද කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. (අ) උන්දැලා හඳුනමි.අනික් පවතක් විචාරත් මුත් උන්දැගේ පවත් මා අතින් විචාරන්නට නො කැමැත්තේ යැය' කී කල්හි සෙසු පවතින් මට ප්‍රයෝජන නැත. මට වුවමනා ඒ පවතමය කිවුය. මුඹ තත්පරව විචාරන පසු කිවමනාවේ ද? ඊයේ රෑ දෙවරු වැසිවට නියාව දුටුවේ ඇද්දැයි විචාළෝය.

(i) "උන්දැගේ" යනුවෙන් හඳුන්වන්නේ කවුද?

(ii) මෙම සංවාදය යෙදෙන්නේ කා අතරද?

(iii) ඊයේ රාත්‍රියේ දුටුවේ නැති දැයි විමසන්නේ කුමක්ද?

(iv) "පවත්, තත්පරව" යන වචනවල අර්ථය ලියන්න. (ලකුණු 04)

(ආ) එම්බල, කොල මෙතෙක් කල් මා තෙරුන් වහන්සේට දුන් පිළී ගෙන ගියේ තෙපිමදැ"යි විචාරා එසේය.ස්වාමීනි කී කල්හි ඒ උපසකයා ඔහු අතින් පිළි හැරගෙන "මතු මෙසේ වූ සොර කමෙක් කෙරෙහි ද නොකෙරෙයිදැ'යි කිය කියා අතින් පයින් ඔහු තළා දුර්වල කොට අමු සොහොනට ඇදගෙන ගොස් පළමු ගෙන ගොස් දැමූ අලුත් මළ මිනිසකු අධෝමුඛ කොට මුහුණින් බිම හොවා ඔහු පිට සොරා උඩුකුරු කොට වැද හොවා දෑත දෙපය පිට ඉස ආදී තැන් මුදාගත නොහැකි පරිද්දෙන් වෙන වෙන ම තද කොට බැඳ හොවා තුමු ඉස් ශෝධා නාහා පළමු කොට ගමට අවුත් ගම්මැද සිට.

(i) උපාසකයා විසින් සොරා මළ මිනියට තබා බැද දමන ලද්දේ කෙසේද?

(ii) අතින් පයින් ඔහු තලා දුර්වල කොට මෙහි "අතින් පයින් " යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.

(iii) උපාසකයා හොරාට තැලීමට හේතු වූ කරුණ කුමක්ද?

(iv) අධෝමුඛ "දෑත බැඳ හොවා" යන පදවල අර්ථ ලියන්න. (ලකුණු 04)

(ඉ) එකල්හි තාපසයෝ ඉතාම දුර්වල ව ශරීරයක් ඇති මිරිකුණා වූ චක්ෂුරාදී ඉඳුරන් ඇති බිසවුන් දැක දුර්වල වූ කාරණා විචාරන්නා ව මෙසේ කියාත් "රජ කුමාරිකාව", මේ බරණැස් නුවර රෑ දවල් ඇති සන්නාහයෙන් සරහන ලද ඇත් පිට සත්සියක් පමණ යුද්ධ ක්‍රීඩාවේ දක්ෂ වූ යෝධයෝ පඤ්චායුධ සන්නද්ධ ව රැකවල් ගෙන සිටින්නාහ. අවිරාධවේධීව සොළොස් දහසක් පමණ ධනුර්ධරයෝ මෙසේම රැකවල් ගෙන සිටින්නාහ. මෙසේ සුරක්ෂිත ව රැකවල් ගෙන සිටිනා ලද මෙනුවර කෙසේ සතුරු කෙනෙක් දකින්නෙහි ද

(i) මෙම සංවාදය කෙරෙන්නේ කා අතරද?
(ii) නුවර ආරක්ෂාවට සිටින්නෝ කවුරු ද?
(iii) බිසවගේ ශරීර ස්වභාවය කෙබඳුද?
(iv) 'චක්ෂුරාදී','අවිරාධවේධි' පදවල අර්ථය ලියන්න. (ලකුණු 04)

(ඊ) පියකරු තෙනෙන් පැරදී පිවිසි වන විල
පිවිතුරු හසුන් එන ලෙද යළිගෙදිගු විල
පිවිතුරු මෙපුරවර අඟනන් වෙමින් ලොල
පියයුරු පටින් බැඳ වසති'යි සිතේ බල

කලා සපිරි සිසිවත මන කලාවන්
නිලා තිබෙන බැම ඉඳු දුනු පිලාවන්
දුලා තනන තන රනහස පිලාවන්
බලා පයැද යනු බැරි පුර කලාවන්

(i) හංසයන් විල් අතහැර ගියේ ඇයි ?
(ii) හංසයන් නැවත විල් කරා ගෙන්වා ගැනීමට පුර අඟනන් කළේ කුමක්ද?
(iii) කවියා පුර කාන්තාවන්ගේ ඇස් බැමි දකින්නේ කෙසේද?
(iv) "දුලා තනන තන රනහස පිලාවන්" මෙහි ඇති කාව්‍යාලංකාරය කුමක්ද? (ලකුණු 04)

(II).

❖ පහත සඳහන් උද්ධෘත හතරක අවස්ථා සම්බන්ධය ලියන්න.

(i) සෙසු වුවමනා දවස් නැති හෙයින් අදම වුවමනා ද?
(ii) මම තොප කෙරෙහි ප්‍රසන්නයෙමි.
(iii) ස්වාමිනි මම මේ ආත්ම භාවයෙහි අනෙක් කෙනෙකත් සේ ව ගියෙමි.
(iv) සම්පූර්ණයෙන්ම බොරු නොවේ. ටිකක් ඇත්ත.
(v) ඔබ එහෙ ඉන්න ඕනෑ කාලෙ ගමට ආවා.
(vi) ඒක පෙන්නන්ඩ පුලුවන් පස්සේ. (ලකුණු 08)

Education NCP - www.edncp.lk

(උ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මුනි සිරිපා සිඹිමින් නේ
සමනොළ ගිරි පදෙසින් නේ
මඳ සුළඟයි මේ එන් නේ
මගේ පුතා නිදියෙන් නේ

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහිකොට මෙලො වේ
යුතුකම ඉටු කළ යුතු වේ

විජය තුමා තම්මැන් නේ
පිරිවර සෙත් සමඟින් නේ
සිටි සැටි දැන් සිහි වෙන් නේ
මගේ පුතා නැළවෙන් නේ

දෙන දිවි මුත් රට වෙනු වෙන්
ජාතික දරුවන් ලැබු වෙන්
මීදි නොයෙක් සතුරු මු වෙන්
ලක් මව විසුවාය සු වෙන්

තවුසෙකු සේ ඇඳ පැල ඳා
පඬුවස් දෙව් මහ නිරි ඳා
මාකඳුරින් ගොඩ බට දා
මඟුලක් වී රට මුළු දා

දෙව් පුර මෙන් දෙවියන් නේ
සිරි ලක් දිව් බබළන් නේ
එහි සක් දෙව් රජු මෙන් නේ
මගේ පුතා ලොකු වෙන් නේ

Education NCP - www.edncp.lk

ලස්සන මෙන් මහ පොළො වේ
අනුරපුර ඉදි කෙරු වේ
දොරමඬලේ කුමරිඳු වේ
උඹට පුතේ සුව එළ වේ

ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහො තේ
සුන්දර සුරඹුන්ගේ අ තේ
නැළවෙන බව සිතනු පුතේ

සිරි මහ බෝ සිඹිමින් නේ
මහ මෙව්නා පෙදෙසින් නේ
සුළං දැළක් මේ එන් නේ
මුටසිව රජු සිහි වෙන්නේ

ලක් වැසියන් කෙරෙහි නැ මී
අරහත් මහ මිහිඳු හි මී
පෙවුවෙ උතුම් සදහම් මී
පුත නුඹටත් පොවමි එ මී (ලකුණු 16)

(02). සද්ධර්මරත්නාවලි කතුවරයා චරිත නිරූපණයේදී මානව දයාව ඉස්මතු වන ආකාරයට චරිත ගොඩ නඟා ඇත. නිර්දිෂ්ට කතා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

නැතහොත්

ඒ ඒ අවස්ථාවලදී මිනිස් සිත් තුළ පවත්නා චෛතසිකවල ස්වභාවය ජාතක කතාකරුවා මැනවින් නිරූපණය කර ඇත. නියමිත කතා දෙකක් ඇසුරෙන් විභාග කරන්න.

(ලකුණු 15)

(03). සද්ධර්මාලංකාර කතුවරයාගේ සජීවි අවස්ථා නිරූපණ කුසලතාව කතා රසය වැඩි කිරීමට හේතු විය මේ කියමන අදාළ නිර්දිෂ්ට කතා ඇසුරින් විමසන්න. (ලකුණු 15)

Education NCP - www.edncp.lk

(04). ගිරා සංදේශයෙහි එන ස්වභාව සෞන්දර්ය වර්ණනා අපූර්වත්වයෙන් යුතු වර්ණනා වේ. නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 15)

(05). මළගිය ඇත්තෝ නව කතාවේ නොරිකෝස්ංගේ චරිතය පාඨකයන්ගේ අනුකම්පාවට ලක් වූ චරිතයකි. සුදුසු උදාහරණ යොදාගනිමින් මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(06)." කෙටි කතාකරුවා සිය නිර්මාණ තුළින් සමාජයේ පුද්ගලයන් මුහුණ පාන ගැටලු කලාත්මකව සාකච්ඡා කරයි". මේ කියමන නියමිත කෙටි කතා දෙකක් ඇසුරින් විමසන්න. (ලකුණු 15)

(07). නූතන කවීහු සිය අත්දැකීම් නිරූපණය කිරීමේදී අභිමත පරිදි කාව්‍ය ආකෘතීන් යොදා ගනිති. මේ කියමන කවීන් තිදෙනෙකුගේ නිර්මාණ ඇසුරින් විමසන්න. (ලකුණු 15)

(08) රත්නාවලි නාට්‍යය සාර්ථක වූයේ නාට්‍යෝචිත අවස්ථා සාර්ථකව යොදාගත් නිසාය. මේ කියමන නාට්‍ය පෙළ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2017

ශ්‍රේණිය
12

## විෂයය - සිංහල II

පාසලේ නම : ........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ....................................................

....................................................... කාලය : පැය 3 යි.

- **I කොටසේ 01 ප්‍රශ්නයට ද II කොටසේ 02, 03 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න**

01.

1.1 වර්ගාන්තාක්ෂර සේ සැලකෙන්නේ කවරක්ද?

(1) ඝ, ඣ, ඪ, ධ, භ (2) ශ, ෂ, ස, හ, ෆ (3) ඞ, ඤ, ණ, න, ම
(4) ය, ර, ල, ව (5) ක, ච, ට, ත, ප (............)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) කණිෂ්ඨ, ප්‍රථිපල, සීඝ්‍ර, වර්ධනය

(2) ප්‍රස්ථකාලය, සම්ප්‍රදාන, මර්දනය, අභිලාෂ

(3) වීරෝධාර, පරමාර්ථ, දෘෂ්ටි, ශිෂ්ටාචාරය

(4) ලේඛනය, අළුයම, අෂ්ඨ, ග්‍රහනය

(5) කොට්ඨාසය, වලාකුළ, ප්‍රස්තාර, විශිෂ්ට (............)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) ජපානය, චීනය, රුසියාව, කැනඩාව

(2) ඉන්දියාව, ලංකාව, ඇමරිකාව, ප්‍රංශය

(3) බ්‍රසීලය, ලිබියාව, සිරියාව, ඉතාලිය

(4) පකිස්ථානය, නෝර්වේ, තුර්කිය, ග්‍රීසිය (............)

(5) කුවේට්, කොරියාව, නවසීලන්තය, පොලන්තය

1.4 .පහත සඳහන් වරණ අතුරින් නිවැරදි වරණය තෝරන්න .

(1) "මුලිනුපුටා" යන පදය ස්වරාදේශ සන්ධියට අයත්ය.

(2) "දස බල" යනු දකාරාර්ථ සමාසයට අයත් පදයකි.

(3) "වූ කලී" යනු අවධානාර්ථයේ නිපාත පදයකි.

(4) ප්‍රාර්ථනාවක් සහිත වාක්‍යයෙහි කර්තෘ අනුක්තයි.

(5) රකාරාංශය වෙනුවට රේඵය යෙදිය හැකිය. (............)

Education NCP- www.edncp.lk

1.5 යංශය, රේඵය, රකාරාංශය හා ගයනු කිත්ත සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) වාක්‍යය, ස්වර්ගීය, චක්‍ර, වනෞෂධ

(2) භාග්‍යය, අක්‍රමවත්, බෞතිස්ම, සර්ව.

(3) ගද්‍යය, අලෞකික, ක්‍රමය, මාර්ගීය.

(4) ද්‍රව්‍යය, අවර්ණ, අබෞද්ධ, කාය ශක්තිය

(5) ප්‍රමාණය, ක්‍රමවේදය, ඖෂධ, සෞඛ්‍ය (...........)

1.6 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) පියෙදු කිරිය, මිහිඳු තෙර, රජමහා විහාරය, අගමැති මන්දිරය

(2) සූර්ය මණ්ඩලය, භාරත දේශය, තෑගි ප්‍රදානය, ඡන්දස් ශාස්ත්‍රය

(3) හස්තිශෛල පුරය, විද්‍යුත් ආලෝකය, ථූප වංශය, මූල්‍ය ප්‍රතිපාදන

(4) කාන්තා කාර්යාංශය, රාජ්‍ය සභාව, සන්ධ්‍යා පුවත්, යහපාලනය

(5) සර සඳ, සුබ පැතුම්, ලිඟු අදියර, අග විනිසුරු (...........)

1.7 තත්සම වචන පමණක් අන්තර්ගත වරණය කුමක්ද?

(1) වෛශාඛ, ප්‍රෞඪ, ගවේෂණ, කෞශල්‍ය

(2) ඉෂ්ට, පස්වග, වර්ෂ, නිරූපණ

(3) ප්‍රදර්ශන, මාලිගා, ගැටලු, ඍතු.

(4) වක්‍රෝන්ති, අබිනය, නාට්‍ය, අලංකාර

(5) පුරහල, පිළිවෙළ, වලාකුළ, පොකුණ (...........)

1.8 මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) අසංවර - සංවර, සංයත, දැමුණු, දාන්ත

(2) වංක - නොවක්, අවංක, අකුටිල, ඍජු

(3) අප්‍රධාන - ප්‍රමුඛ, ප්‍රධාන, මුඛ්‍ය, අවශේෂ

(4) අසරණ - පිහිට, සරණ, උපකාර, උදව්

(5) දුඃඛ - සුඛ, සන්තුෂ්ටි, ප්‍රහර්ෂ, සෞමනස් (...........)

1.9 මුලින් දී ඇති පදයට සමානර්ථ පදයක් ඇතුළත් නොවන වණය තෝරන්න.

(1) කෝමල - මුදු, මෘදු, සිනිදු, සොමි

(2) පෙරදිග - පැදුන් දෙස , ප්‍රාචීන, නැගෙනහිර, ඉඳුරු දෙස

(3) මිතුරු - සුහද, මිත්, සකි, මිත්‍ර

(4) නිමල - විමල, නිර්මල, පිරිසිදු, නිමල්

(5) පිපුණ - විකසිත, පුල්, පුබුදු, ප්‍රබෝධ (...........)

Education NCP - www.edncp.lk

1.10 විභක්ති, දකාරාර්ථ, විශේෂණ, අව්‍ය යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති පද පේළිය තෝරන්න.

(1) කුරුලුසර, පොත්පත්, සුසිරිත්, ත්‍රිලක්‍ෂණ

(2) සොරබිය, දුකසැප, රතුමල්, අපමණ

(3) අකුසල්, කිරිබත්, ඇත් අස්රිය, දසපනත

(4) හිරසඳ, සඳවත, මිහිඳුම්, කුකවි

(5) නවදොර - ගස්වැල්, ළමා පොත්, අනුබල (...........)

1.11 කෘදන්ත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.

(1) නටන, ගයන, දුවන, බමන

(2) බැලු, කළ, කෑ, මැරූ

(3) නැටුමන්, ගැයුමන්, අවමන්, දෙසුමන්

(4) නැටීම්, ගැයීම්, වැයීම්, කැපීම්

(5) වැටුණු, මැරුණු, කැඩුණු, රැකුණු (...........)

1.12 පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියාවර්ගය පිළිවෙළින් දක්වා ඇති වර්ණය තෝරන්න.

- බල්ලන් **බුරද්දී** සොරු ගෙට ඇතුල් වූහ.
- අම්මා බෙහෙත් **බී** නිදා ගනියි.
- නැන්දා මෙහෙකාරිය ලවා රෙදි **සෝදවයි.**
- හාවා **පැන පැන** දුවයි.

(1) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා ,ප්‍රයෝජ්‍ය ක්‍රියා

(2) ප්‍රයෝජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(3) මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(4) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(5) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා (...........)

1.13 අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් ඇති පද පේළිය අයත් වරණය තෝරන්න.

(1) දරුවන්, මිනිසුන්, වඳුරෝ, කාන්තාවන්

(2) මැණියන්, පියාණෝ, තොප, දෙවඟනක

(3) වනිතාවක්, මාතාවක්,කුමාරතුංගයන්,මා

(4) බල්ලෙක්, ගොනකු, දෙවියකු, මුවෙකු

(5) තා, අප, හිඟන්නන්, ඇවිදින්නෝ (...........)

Education NCP - www.edncp.lk

1.14 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

(1) උද්ධමනය, ප්‍රබල, දුෂ්කර, සුගන්ධ

(2) නිර්මල, සපුරණ, කුසල්, විගමන

(3) දුර්ගුණ, උදුළ, ආයාචන, සම්බාධක

(4) දුබල, අනුමෝදන, අවමානය, සංයෝගය

(5) අතිශූර නිසසල, පිළිසඳර,විපක්‍ෂ (…………)

1.15 "තේක්ක **අරටුවෙන්** තැනූ අල්මාරියේ දොර **ඇර** එහි **පොත්පත්** තැන්පත් කළේය". යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තදකළු අකුරෙන් ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගයටද?

(1) සමාස, තද්ධිත, පූර්ව ක්‍රියා

(2) පූර්ව ක්‍රියා , තද්ධිත, සමාස,

(3) තද්ධිත, පූර්ව ක්‍රියා, සමාස

(4) තද්ධිත, සමාස, පූර්ව ක්‍රියා

(5) සමාස, පූර්ව ක්‍රියා, තද්ධිත (…………)

1.16 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය තෝරන්න.

(1) නැටිලි, කැපිලි, ගැරහිලි, කෙදිරිලි

(2) කැඩිති, පොඩිති, කැබිලිති,කැඳලි

(3) මෙන්, සේ, බඳු, උප

(4) මලසුන, සිහිනිඟ, උපනුපන්, අතිනත

(5) දුසිරිත්, දුදන, අතිරස, කුකවි (…………)

1.17 සමාස පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) කිරිබත්, පින්හාල්, සොරබිය, බුදුගුණ

(2) සැරියුත් මුගලන්, අඹුසැමි, ඉරහඳ, තිනෙත්

(3) ගෞරවතර, පොල්තෙල්, වනමල්, ගම්වැසි

(4) දිනකර, සහසැස්, මලවි, දැමිඳුරු

(5) කහ කුරුල්ලා, පාපියුම්, පංසිල්, සඳවත (…………)

1.18 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තොරන්න.

(1) දකුණත, මලසුන,ගංවෙරළ, වීරෝදාර

(2) රුක්කත්තන, ගෙවුයත්, මුනිතුමා, උපනුපන්

(3) පොල්ලන්ත, වක්කත්න, දෙයාකාර, කටුවල

(4) අත්කම්, ගෙත්කම්, ලිග්ගල, මුලකුරු

(5) පිළියම්, සුරුවම්, දඩයම්, මැළියම් (…………)

Education NCP - www.edncp.lk

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තොරන්න.

(1) ඔවුහු කන්ද බසිද්දි ඇතෙක් ඉදිරියට අවේය.

(2) ඇතැම් සම්ප්‍රදායන් වෙනස් වී ඇත.

(3) විදාගම හිමියන් බුදුගුණ අලංකාරය රචනා කළහ.

(4) ගංගාවන් මුහුදට ගලති.

(5) මිනිසුන් නිරෝගී වෙත්වා. (…………)

1.20 වඩාත් ම නිවැරදිව පද බෙදීම සහිත වාක්‍ය තෝරන්න.

(1) ගමේ ප්‍රභුවරයෙකු වූ ධනපාල දානපතියෙක් විය.

(2) පද බෙදීමේදී සිදුවන වැරදි අවම කර ගැනීමට මම නිරතුරුවම සිතමි.

(3) වවුලා නිශාචර මෙන්ම ක්ෂීරපායි සත්වයෙක්ද වේ.

(4) ප්‍රචණ්ඩත්වය, බොහෝ රටවල විවිධාකාරවූ ගැටීම් ඇති කරයි.

(5) අම්මා ආපසු පැමිණෙනතුරු මම පාසල් පුස්තකාලයට වී සිටියෙමි. (…………)

(ලකුණු 20)

02. (අ) පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වක්‍රෝක්තිය වූ කලී කාව්‍යයේ යෙදෙන අලංකාරයන්හි පමණක් නොව කාව්‍ය පුරා පවතින මුඛ්‍ය ලක්ෂණය බව භාමහගේ විශ්වාසයයි. කාව්‍යය අවශේෂ ලේඛනයෙන් වෙන් කොට ගැනීම වක්‍රෝක්තිය පදනම් කොට ගෙන සිදුවන්නකි. ඉතිහාසය, ශාස්ත්‍රාදී ලේඛන වක්‍ර භාෂණයෙන් තොර ඍජු උක්ති ක්‍රමයක් අනුගමනය කරන රචනාවේ.කාව්‍යය අලංකාරොක්තීන්ගේ මාර්ගයෙන් වක්‍රෝක්තිය ගුරු කොට ගනී. "කිසියම් අදහසක් හුදක් වචන මාර්ගයෙන් ප්‍රකාශ කිරීමෙන් වචනයෙන් ශොභාවක් - කාව්‍යමය චමත්කාරයක් - හට නොගනී. එබඳු සොබාවක් ඇති කරවනුයේ වක්‍රෝක්ති නම් උක්ති ක්‍රමය මගිනි'යි.භාමහ පවසයි. වක්‍රොක්තියෙන් තොරව වු වර්ණා ක්‍රමය භාමහ හඳුන්වන්නේ වාර්තා නමිනි. වාර්තා යනු කාව්‍ය තත්ත්වයට පත් නො වන ශාස්ත්‍ර ඉතිහාසාදී වශයෙන් යමක් සිදුවූ සැටියෙන් ම පවසන වාර්තා ක්‍රමයවේ."සූර්යයා බැස ගියේය. හඳ බබළයි. පක්ෂීහු කැදලි කරා යෙත් " වැනි කියුම් කාව්‍ය නොවේ. ඒවා හුදෙක් වාර්තා පමණි වක්‍රෝක්තියකට නොනැගු ඍජු භාෂණ බැවිනි.

(i) මේ ඡේදයෙහි දැක්වෙන ආකාරයට 'වාර්තාව' යනු කුමක්ද?

(ii) වාර්තා කථනය චමත්කාරයක් උපදවන්නේ නැත්තේ ඇයි?

(iii) කාව්‍යය පුරා පවතින ප්‍රධාන ලක්ෂණය කුමක්ද?

(iv) "උක්ති ක්‍රමය" යන්නෙන් කුමක් අදහස් කෙරේ ද?

(v) "හිරු බැස යයි, සඳ බබළයි, පක්ෂීහු කැදලි කරා යෙත් " යන කියුම් කාව්‍යමය සන්ධ්‍යා වර්ණනයක් හැටියට ගත හැකිද? (ලකුණු 10)

Education NCP www.edncp.lk

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ආර්ථික අපහසුතා මැද ජීවත් වෙන වත්මන් මධ්‍යවේදීන් ආර්ථික ස්ථාන තර කර ගැනීමේ අපේක්ෂාවෙන් මුදලට වහල් වන්නේ ද? නැතහොත් ජීවිතයට විවිධ තර්ජන එල්ල කර ගනිමින් පාඨක සමාජයට සත්‍ය හෙළි කරනවා ද? යන ප්‍රශ්නයට මුහුණ පා ඇත. තම හෘද සක්ෂියට අනුව නිවැරදිව කටයුතු කරන පුද්ගලයකු නම් ඔහු තම රැකියාවේ ආචාර ධර්ම ආරක්ෂා කළ යුතු වේ. එසේ කළ විට සමාජයේ පාඨකයන්ට නිවැරදි සත්‍ය දේ ලබා ගත හැකිවේ. ඉන් සමාජය යහ මග යන අතර, සමාජ සාරධර්මවල යහපත් බීජ මහාමේරු පර්වතය සේ අපරාධ ඉදිරියේ නොසැලී සිටිනු ඇත.

සමාජය පවතින අපරාධ, මිනීමැරුම්, මත්ද්‍රව්‍ය වෙළදාම් ආදිය නැවැත්විය හැකි වන්නේ ද මුද්‍රිත මාධ්‍යවේදීන්ට ය. ඒ සඳහා මුද්‍රිත මාධ්‍යයේ මාධ්‍යවේදීන්ට බොහෝ දේ කළ හැකි වේ. මෙයට ලෝකයේ පවතින ආර්ථික ප්‍රභවයන් බලපා තිබේ. කෙසේ නමුත් ලෝකයේ සංවර්ධිත රටවල් විශාල වශයෙන් විද්‍යුත් මාධ්‍යයන්ට නැඹුරු වුව ද එම රටවල ද මුද්‍රිත මාධ්‍ය කලාවේ නැඹුරුතාව ලබාදෙන පිරිස් සිටිති. එයට නිදසුන් ලෙස ලෝකයේ මහාද්වීපවල නියම තොරතුරු ඉතා සාරවත් ලෙස පාඨකයාට ලබා දෙන සඟරා, පොත්පත් තිබේ ද? ඒවා කොතරම් දුරට සමාජයේ ජනාදරයට පත්ව තිබේ ද? එම නිසා සංවර්ධිත රටවල ද මුද්‍රිත මාධ්‍ය කලාව ඉතා දියුණු වී තිබේ. එමගින් බොහෝ දේ හුවමාරු කර ගැනීමට හැකි වී තිබේ. ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවල මුද්‍රිත මාධ්‍ය කලාව ද නොදියුණු බව පිළිගත යුතු ය.

(ලකුණු 15)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වනසේ විශ්ලේෂණාත්මක රචනයක් ලියන්න.

(i) අපථ්‍ය ආහාර වෙනුවට වසවිස නැති ආහාර හඳුන්වා දීමෙන් ලැබෙන ප්‍රතිලාභ.
(ii) ශාරීරික හා මානසික සෞඛ්‍ය උදෙසා ක්‍රීඩාවෙන් ලැබෙන පිටිවහල.
(iii)මිනිසා පරිසරයට එරෙහි වීමෙන් අත් වූ ප්‍රතිවිපාක.
(iv)පරිසර සුරැකීමේ අවශ්‍යතාව.
(v) මුහුණු පොත වෙබ් අඩවියට ඇබ්බැහිවීම නිසා නොමග යන තරුණ පරපුර. (ලකුණු 25)

04. පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(අ) (i) මා ප්‍රදේශයේ හොඳ ගුරුවරයෙක් වෙමි.

(ii) කමනීත් පියලුත් මමත් ගමට යමි.

(iii) උණ රෝගීන් පනස් දෙනෙක් රොහල් ගත කරනු ලැබූහ.

(iv) අනුරාධපුර යුගයේ කාන්තාවෝ පවා රටේ සංවර්ධනයට හවුල් විය.

(v) පාසල් සිසුහු සංවර විම යෙහෙකි. (ලකුණු 05)

Education NCP- www.edncp.lk

(ආ) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

(i) මෙතෙම දිනපතා කවියෙන් අප සතුටු කළේය.

(ii) ගම්වැසියෝ ගෞරවයෙන් ඇය පිළිගත්හ.

(iii) සත්පුරුෂයෝ අසරණයින්ට පිහිට වූහ.

(iv) තාත්තා මේ මාසයේ වැටුපෙන් පා පැදියක් ද වසු පැටියෙකු ද මිලදී ගත්තේ ය.

(v) වෛද්‍යවරයා දිනපතා රෝගියා පරීක්ෂා කළේය. (ලකුණු 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) කම්කරුවෙකු වූ සිරිදාස (ලේඛකයෙක්/ ලේඛකයෙකු) ද විය.

(ii) එදා රැස්වීමෙන් සභාපති (ආදෙක්/ ආදෙකු) සේ ලිස්සා ගියේය.

(iii) රටට බත සපයන්නෝ (ගොවියෝ ය./ ගොවියන් ය.)

(iv) එදා රාත්‍රියේ (ත්‍රස්තවාදීන්/ ත්‍රස්තවාදිනු) දුවනවා අපි සියැසින් දුටුවෙමු.

(v) මා හැමදාම පාඩම් (නොකරමියි / නොකරතියි) අම්මා දොස් කීවාය. (ලකුණු 05)

05.

(අ) පහත දැක්වෙන වාක්‍යවල තදකළ අකුරෙන් දක්වා ඇති පදවල අර්ථය විග්‍රහ කර ලියන්න.

(i) අනුරාධපුර අසළින් **මෙහෙණවරක** නටඹුන් හමුවිය.

(ii) **මුග්ධ** මිනිසා කළ වැඩේ කවුරුත් අනුමත නොකළහ.

(iii) නිර්මාණකරුවාට **සතතාභ්‍යාසය** අවශ්‍යයි. (ලකුණු 03)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු තනි පද ලියන්න.

(i) රජුගේ ගුණ වර්ණනා කරන්නා

(ii) කෙළෙහි ගුණ නොදන්නා

(iii) පුරාවස්තු එක් රැස් කොට තබා ඇති ස්ථානය. (ලකුණු 03)

Education NCP - www.edncp.lk

(ඉ) පහත දී ඇති වාක්‍යවල හිස්තැන් සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ගියවර රාජ්‍ය සාහිත්‍ය ................................................ යාපහුවේ දී පැවැත්විණි.

(ii) ................................................ මනසක් ඇති ඔහු මෙවරත් විභාගයෙන් අසමත් විය.

(iii) හොඳ කලා කෘතියකින් ................................................ අපූර්ව ආස්වාදයක් ලබයි.

(iv) නළුනිළි කණ්ඩායම සභා ................................................ ප්‍රබෝධයට පත් කළහ.

(v) ප්‍රාචීණ භාෂාවලින් ලබන ලද ................................................ සිංහල සාහිත්‍ය පෝෂණයට හේතු විය.

(vi) සද්ධර්ම රත්නාවලිය ධම්මපදට්ඨ කතාවේ ................................................ නොවේ.

(ආභාසය/ සහෘදයා/ ව්‍යාකුල/උලෙළ/ගර්භය/පරිවර්තනය) (ලකුණු 03)

(ඊ) තද කළු අකුරෙන් දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍ය බැගින් ලියන්න.

(i) **<u>සක්</u>** හඬින් දෙවොල ගිගුම් දෙයි.

(ii) එම ලීයට ඔහුගේ **<u>කර</u>** තුවාල විය.

(iii) මගේ සහෝදරයා **<u>කඩ</u>** හිමියෙකි.

(iv) අප හැමෝම **<u>ගත</u>** සිත සංවර කර ගත යුතුය.

(v) භික්ෂු ජීවිතය **<u>වත්</u>** පිළිවෙත් නිසා බබළයි.

(vi) නිදහස් දින **<u>තුරු</u>** ගොස දසත පැතිරිණි. (ලකුණු 06)

06.තද කළු අකුරින් දක්වා ඇති පද කුමන ව්‍යාකරණ අංගයට අයත්දැයි දක්වන්න.

(i) **<u>මිනිසුන් විසින් කරන</u>** ඇතැම් ක්‍රියා **<u>නිසා</u>** තිරිසන් සත්තු ද අපහසුතාවට පත් වෙති.

(ii) **<u>වෙසක් මාසය</u>** තුළ දී ලංකාව පුරා බොහෝ **<u>ප්‍රනොෘත්සව සංවිධානය</u>** කර ඇති බව හෙතෙම පැවසීය.

(iii) සුළඟට බිම පතිත වූ **<u>ගසෙහි</u>** සිටි **<u>පක්ෂියෙක්</u>** අහසට **<u>වේගයෙන්</u>** ඉගිළි ගියේ ය.

(iv) **<u>මුහුදු සුළං</u>** සැඩ **<u>වූ</u>** බැවින් නෞකාවෝ ක්‍රියා **<u>විරහිත</u>** වූහ.

(v) **<u>ගුරුතුමා</u>** පන්තියට **<u>පැමිණ</u>** **<u>කළු ලෑල්ලේ</u>** සටහනක් තැබීය.

(ලකුණු3x5= 15)

Education NCP - www.edncp.lk

07.පහත දී ඇති යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(අ) (i) ඉතා අවදානම් දෙයක නිරත වීම.

(ii) නරක දෙයකට තවත් නරක දෙයක් එක් වීම.

(iii) කෙනෙක් කරන ක්‍රියාවෙන් වෙන කෙනක් ප්‍රයෝජන ගැනීම.

(iv) තමා වැරදි කරමින් අන් අයට උපදෙස් දීම

(v) අයමාර්ග නැති කර ගැනීම.

(vi) නරක මිනිසුන් අතරේ හොඳ මිනිසුන් ද සිටීම. (ලකුණු 03)

(ආ) පහත දී ඇති රූඪීවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

(i) ඔළුව ඉදිමීම.

(ii) පාලු ගෙයි වළන් බිඳීම

(iii) සුදුලූනු පොඩි කිරීම

(iv) පිස්සිගේ පළාමල්ල වගේ

(v) අං ඇවිල්ලා

(vi) වැලේ වැල් නැතිව (ලකුණු 03)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පද සෑදී ඇති රටාව කුමක්දැයි දක්වන්න.

(i) ලට්ට - ලොට්ට (ii) ලියා - කියා

(iii) උදව් උපකාර (iv) මුදල් හදල්

(v) ඉහළ -පහළ (vi) වස - විස (ලකුණු 03)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශිය ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාරයේ යෙදෙන පද ලියා දක්වන්න.

(i) කුදගයි (ii) වාං පතුල්

(iii) ඔයනවා (iv) පුන්නනවා

(v) හින්නා (vi) සකලයා (ලකුණු 03)

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

(i) මුත්තෙට්ටුව (ii) ගඟුලබානවා

(iii) අට හොඳයි (iv) කිරිකොඩුකාරයා

(v) කලවිට (vi) අතංගුව (ලකුණු 03)

Education NCP - www.edncp.lk

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගිරාසංදේශයෙහිඇතුළත්මේවිජයබාපිරුවන්වැනුම්අනුවවිජයබාපිරුවනකෝට්ටේයුගයේපැවැති ශ්‍රේෂ්ඨතම පිරුවන්අධ්‍යාපනිකශාස්ත්‍රිපිඨයබැව්කිවයුතුය.මේවිජයබාහුපිරුවෙනෙහිඅධ්‍යයනයකළශිෂ්‍යයෝත්‍රිපිටකය ව්‍යාකරණයසිංහලපාලිසංස්කෘතප්‍රකෘතදෙමළභාෂාවන්දකාව්‍යනාටකයන්දවේදඅර්ථශාස්ත්‍රයආදී ශාස්ත්‍රයන්දමැනවින්හැදෑරීමකළහශ්‍රී රාමචන්ද්‍රභාරතී නම්පඬිවරයාආදී විදේශ ශිෂ්‍යයෝද මේ පිරුවනේ සතුටින්ඉගෙනගත්හ.

(i) ඉහත ඡේදය ශාස්ත්‍රීය යැයි බොහෝ සෙයින්ම පිළිගත් ක්‍රමය අනුව පද බෙදා අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) මෙහි ඇති රකාරාංශය අන්තර්ගත වචන දෙකක් ලියන්න.

(iii) ගැටය සහිත ඇලපිල්ල අන්තර්ගත වචන දෙකක් ලියන්න.

(iv) මෙහි ඇතුළත් තද්ධිත පදයක් උපුටා දක්වන්න.

(v) මෙම ඡේදයේ සඳහන් නොවන ගැට සහිත ඇලපිලි දෙකක් අන්තර්ගත වන වචන දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 15)

Education NCP - www.edncp.lk